**2023/2024 වර්ෂය සඳහා ඉඩම් මහ ලේකම් කාර්යාලයට සහ ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට අයත් කාර්යාලවලට ආරක්ෂක සේවා සැපයිම සඳහා මිල ගණන් කැඳවීම**

බත්තරමුල්ල, රජමල්වත්ත පාර, අංක 1200/6, 'මිහිකත මැදුර', ඉඩම් මහ ලේකම් කාර්යාලයේ පහත දැක්වෙන කාර්යාලයන්ට 2023.03.01 දින සිට 2024.02.28 දින දක්වා අවුරුදු එකක කාලයක් වෙනුවෙන් ආරක්ෂක සේවා සැපයීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ ලියාපදිංචි ආරක්ෂක සේවා ආයතනයන්ගෙන් මිල ගණන් කැඳවනු ලැබේ.

(අ) ඉඩම් මහ ලේකම් කාර්යාලය, 'මිහිකත මැදුර', අංක 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

(ආ) රජයේ ඉඩම් තොරතුරු සහ කළමනාකරණ මධ්‍යස්ථානය සහ ලෝක ආහාර ගබඩාව සහ කාර්යාලය, බොරුපන පාර, රත්මලාන.

02. ලංසුකරුවන් ආරක්ෂක සේවාවන් සැපයීමෙහි ලා බලයලත් හා සුදුසුකම්ලත් සැපයුම්කරුවන් විය යුතුය.

03. මේ සඳහා උනන්දුවක් දක්වන යෝග්‍ය ලංසුකරුවන් සඳහා 2023 ජනවාරි 30 දින සිට 2023 පෙබරවාරි 13 දින දක්වා කාර්යාලීය දිනයන්හිදී පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා කාලය තුල එක් ප්‍රසම්පාදන ලිපිලේඛන කට්ටලයක් සඳහා රු.3,500.00 ආපසු නොගෙවන ගාස්තුවක් ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ සරප් වෙත ගෙවීමෙන් හා පහත දැක්වෙන ලිපිනය වෙත ලිඛිත ඉල්ලීමක් කිරීම මඟින් ලංසු ලියවිලි ලබා ගත හැකිය. මෙම ගෙවීම මුදලින් පමණක් සිදුකළ යුතුය. ලංසු ලියවිලි පහත ලිපිනයේදී කිසිදු ගෙවීමකින් තොරව පරීක්ෂා කළ හැකිය.

04. ලංසු ඉදිරිපත් කිරීමේදී රු.110,000.00ක ලංසු සුරක්ෂණ ඇපකරයක් සෑම ලංසුවක් සමඟම ඉදිරිපත් කළ යුතුය. (එය මහ බැංකුවේ පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් ආරක්ෂණයක් ඉදිරිපත් කිරීම හෝ මුදලින් සරප් වෙත ගෙවීමෙන් කළ හැක.) 2023.02.14 දින සිට ඉදිරියට දින 45ක් සඳහා වලංගු වන සේ ඉදිරිපත් කළ යුතුය.

05. මුද්‍රා තබන ලද ලංසු ලියාපදිංචි කරන ලද තැපෑලෙන් සභාපති, ප්‍රසම්පාදන කමිටුව, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව, ඉඩම් මහ ලේකම් කාර්යාලය, 'මිහිකත මැදුර', අංක 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල යන ලිපිනයට එවීමට හෝ දෙපාර්තමේන්තුවේ ගිණුම් ශාඛාවේ ඇති ලංසු පෙට්ටියට බහාලීමට හැක. ලංසුපත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ආරක්ෂක සේවා සැපයීම සඳහා ලංසුව 2023/2024" යනුවෙන් සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ලියවිලි ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. ලංසුපත් භාර ගැනීම 2023.02.14 දින ප.ව.2.00 ට අවසන් වන අතර එම වේලාව ඉකුත් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට එම අවස්ථාවට සහභාගී විය හැක.

07. වැඩි විස්තර අවශ්‍ය වේ නම් ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී (සැපයීම්) වෙතින් ලබා ගත හැක. දුරකථන අංකය 011-2797434 වේ.

එන්.ඒ.ඒ. ශ්‍යාමලී
ගණකාධිකාරී (සැපයීම්)
ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට

එන්. ඒ. ඒ. ශ්‍යාමලී
ගණකාධිකාරී (සැපයීම් හා වත්කම් කළමනාකරණ)
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
"මිහිකත මැදුර"
ඉඩම් මහලේකම් කාර්යාලය
අංක. 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

ඉඩම් කොමසාරිස් ජනරාල්
සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව,
'මිහිකත මැදුර', අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.
2023.01.30